Lesson 35 **May be/ Might be / Must be / Should be / Can be / Could be**

විය යුතුයි / විය හැකියි / වෙන්න පුළුවන්

- දැන් අපි මෙවැනි උදාහරණයක් දෙස බලමු

She is ill - ඇය අසනීපෙන්

දැන් අපිට කියන්න අවශ්‍ය ඇය අසනීපෙන් වෙන්න ඇති කියලා. මීට කලින් විය හැකියි කියන තේරුම දෙන may /might කියන වචන දෙක අපට හමුවුනා. ඒ දෙකින් එකක් පාවිච්චි කලොත් අපිට කියන්න පුලුවන්ද She may ill කියලා ? එහෙම කිව්වොත් වැරදියි

එය කියවෙන්න ඕන she may ill කියල නෙවෙයි she may be ill කියලා. එහෙම නැත්නම් She might be ill කියලා

ඉහත උදාහරණ, may /might , must / should යෙදුනු උදාහරණ දෙස නැවත බැලුවොත් ඔබට පෙනේවි , ඒ පද භාවිතා වෙලා තියෙන්නේ සත්‍ය ක්‍රියා පද සමග . ඒ කියන්නේ , ඒවායින් කුමක් හෝ සත්‍ය ක්‍රියාවක් ප්‍රකාශ වෙන්නේ .
යම් හෙයකින් ඉහත උදාහරණයේදී වගේ am , is , are වැනි උප ක්‍රියා පදයකින් ප්‍රකාශ වන කතෘ පිළිබද යම් තත්වයක් ප්‍රකාශ වෙන අවස්තාවක් ගත්තොත්, ඒ වාක්‍යයෙන් කියවෙන තත්වය "විය හැකියි" " විය යුතුයි " යන අදහස ප්‍රකාශ කරන්න භාවිත කරන්න වෙන්නේ may be , might be , must be , should be යන රූපයන් . ඇත්තවශයෙන්ම be වලින් සංකේතවත් වෙන්නේ are ,is ,are . ඒවාට be verbs කියලත් කියන්නේ ඒකයි. මේ බව තවත් හොදින් පැහැදිලි වෙන්න අපි පහත උදාහරණ බලමු

She is angry about it ඇයට ඒ ගැන තරහයි	-	She may be/ might be angry about it ඇයට ඒ ගැන තරහ ඇති
		She should be angry about it ඇය ඒ ගැන තරහින් විය යුතුයි (කථකයා එසේ සිතනවා ඒ සිද්ධිය ගැන දන්නා නිසා)
		She must be angry about it ඇය ඒ ගැන තරහෙන් විය යුතුයි (කථකයාට හොදටම විශ්වාසයි ඇය තරහින් කියල. මොකද ඇය කතා නොකර ගිය නිසා)

He is busy nowadays - He may be / might be busy nowadays
මේ දවස්වල ඔහු බිසී — ඔහු මේ දවස්වල බිසී ඇති

He should be busy nowadays
ඔහු මේ දවස්වල බිසී විය යුතුයි (අවිරුද්ද අන්තිමේ ඔහු කොහොමත් බිසී)

He must be busy nowadays
ඔහු මේ දවස්වල බිසී විය යුතුයි(ලබන සතියේ ඔහුගේ විවාහය)

He is at home now - He may/ might be at home now
ඔහු දැන් ගෙදර ඉන්නවා — ඔහු දැන් ගෙදර ඉන්න පුළුවන්

He should be at home now
ඔහු දැන් ගෙදර ඉන්න ඕනා (මේ ඔහු ගෙදර ඉන්න වෙලාව)

He must be at home now
ඔහු ගෙදර සිටිය යුතුයි (ඔහුගේ කාර් එක පේන්න තියෙනවා)

- ඉහත ඇතැම් උදාහරණ වල may be / might be තිබෙන තැන වල could be දැම්මත් ඒත් නිවැරදියි. වෙන්න පුළුවන් කියන අදහස could be වල තියෙනවා

  He could be busy nowadays - ඔහු මේ දවස් වල බිසී විය හැකියි
  He could be at home - ඔහු ගෙදර සිටිය හැකියි

මේ ආකාරයේ තවත් නිතර ප්‍රයෝජනවත් විය හැකි උදාහරණ කිහිපයක් පහතින් දී තිබෙනවා

The meeting might be cancelled
මීටින් එක අවලංගු වෙලා වෙන්න පුළුවන්

This may be the correct answer
මේක හරි උත්තරය වෙන්න පුළුවන්

His phone might be switched off
ඔහුගේ ෆෝන් එක ඕෆ් වෙලා / ඕෆ් කරලා වෙන්න පුළුවන්

He should be at school by now
ඔහු මේ වෙනකොට පාසලේ විය යුතුයි

She should be in the advanced level class now
ඇය දැන් උසස් පෙළ පන්තියේ විය යුතුයි

It should be easy to do
එය කරන්න පහසු දෙයක් විය යුතුයි

It may be difficult
එය අමාරු වෙන්න පුළුවන්

It might be broken
ඒක කැඩිලා වෙන්න ඇති

He may be late today
අද ඔහු පරක්කු වෙන්න පුළුවන්

He must be drunk (He is shouting)
ඔහු බීමතින් විය යුතුයි (ඔහු කෑගහනවා ඇහෙනවා)

It must be difficult (He couldn’t do it)
ඒක අමාරු විය යුතුයි (ඔහුට ඒක කරන්න බැරි වුනා)

You must be tired (because it’s a long journey)
ඔයාට මහන්සි ඇති (ඒක දිග ගමනක් නිසා)

You must be hungry (because it’s a long journey)
ඔයාට බඩගිනි ඇති (ඒක දිග ගමනක් නිසා)

She must be at work now (This is her office time now)
ඇය දැන් වැඩ ඇති (මේ ඇයගේ ඔෆිස් ටයිම් එක)

It must be very expensive (It looks very posh)
ඒක ඉතාම මිල අධික විය යුතුයි (ඒකෙ මාර ගති පෙනුමක් තියෙන්නේ)

She must be very happy (She came first in the exam)
ඇයට හරිම සතුටු ඇති (ඇය විභාගේ පළවෙනියට ආවා)

This could be the problem
මේක වෙන්න පුළුවන් ගැටලුව

She could be at the library at this time
මේ වෙලාවට ඇය පුස්තකාලයේ ඉන්න පුළුවන්

The shop could be closed today.
කඩේ අද වහලා වෙන්න පුළුවන්

This could be the solution to this problem
මේ ප්‍රශ්නෙට විසඳුම් මෙය වෙන්න පුළුවන්

You could be right
ඔයා නිවැරදි වෙන්න පුළුවන්

- විය හැකියි කියන තේරුම දෙන්න පාවිච්චි කරන්න පුළුවන් තව යෙදුමක් **Can be**

It can be dangerous
ඒක භයානක වෙන්න පුළුවන්

The sea can be rough these days
මේ දවස් වල මූද රළු වෙන්න පුළුවන් (rough - රෆ් - රළු)

This task can be difficult for beginners
මෙම වැඩය ආරම්භකයන්ට අමාරු වෙන්න පුළුවන් (beginner - බිගින(ර්) - ආරම්භකයා)

The weather can be unpredictable in this time of the year
අවුරුද්දෙ මේ කාලයේ කාලගුණය පුරෝකථනය කල නොහැකි වෙන්න පුළුවන් (unpredictable - අන්ප්‍රෙඩික් බල් - කලින් කිව නොහැකි)

He can be very stubborn at times
සමහර වේලාවට් ඔහු හරිම හිතුවක්කාර වෙන්න පුළුවන් (stubborn - ස්ටබන් - මුරණ්ඩු , හිතුවක්කාරී)

Learning a new language can be fun
නව භාෂාවක් ඉගෙන ගැනීම විනෝදජනක වෙන්න පුළුවන්

Traffic can be heavy in the evening
හවසට ට්‍රැෆික්(රථ වාහන) ඉතා අධික වෙන්න පුළුවන් (මෙතන heavy කියන එකෙන් අදහස් වෙන්නේ "බර" කියන එක නෙවෙයි , අධිකතර කියන එක)

The party can be very noisy
සාදය ඉතා ඝෝෂාකාරී වෙන්න පුළුවන්

Traveling alone can be exciting
තනිවම සංචාරය කිරීම උද්යෝගජනක වෙන්න පුළුවන් (exciting - එක්සයිටිං - උද්වේගජනක)

Parents can be strict sometimes
සමහර වෙලාවට දෙමව්පියෝ ඉතා දැඩි වෙන්න පුළුවන් ((strict - ස්ට්‍රික්ට් - දැඩි , තද (නීති ,රීති , රෙගුලාසි සම්බන්ධව)

Lesson 35 **SPOKEN ENGLISH**

Feeling not well
අසනීප ගති දැනෙමින්

මෙහි පහත දැක්වෙන්නේ ශිෂයෙකු හදිසියේ අසනීප වූ අවස්තාවක කතා බහ වියහැකි දේවල්. ඒවා සංවාදයක් විදියට නෙවෙයි දීලා තියෙන්නේ. එකම අදහස කිහිප ආකාරයකට ඇසිය හැකි විධි මෙහි දී තිබෙනවා . ඒවා හොදින් මතක තබා ගත්තොත් මෙවැනි අවස්තාවකදී ඉතා පහසුවෙන් ඔබට ඒ සංවාද හසුරුවා ගත හැකියි

A - You look tired
යු ලුක් ටය(ර්)ඩ්
ඔයාට මහන්සි පාටයි

You don't look well
යු ඩෝන්ට් ලුක් වෙල්
ඔයාට සනීප නෑ වගේ

Why, what's the problem ?
වයි, වට්ස් ද ප්‍රොබ්ලම් ?
ඇයි, මොකද ප්‍රශ්නේ ?

What's wrong with you ?
වට්ස් රෝං විත් යු ?
ඔයාට මොකද වෙලා තියෙන්නේ

B- I am feeling out of sorts
අයෑම් ෆීලිං අවුට් ඔෆ් සෝට්ස්
මට ඇඟට හරි නෑ

I am not feeling well
අයෑම් නොට් ෆීලිං වෙල්
මට සනීප නැහැ

I am feeling dizzy
අයෑම් ෆීලිං ඩිසි
මට කරකැවිල්ල වගේ

I feel like vomiting
අයි ෆීල් ලයික් වොමිටිං
මට වමනේ යන්න වගේ (ඒ වගේ දැනෙන්නේ)

I feel like fainting
අයි ෆීල් ලයික් ෆේන්ට්ං
මට කලන්තේ වගේ (ඒ වගේ දැනෙන්නේ)

I feel like I am going to faint
අයි ෆීල් ලයික් අයැම් ගොයිං ටු ෆේන්ට්
මට දැනෙන්නේ මාව කලන්තේ කරන්න යනවා වගේ

It's like I am going to faint
ඉට්ස් ලයික් අයැම් ගොයිං ටු ෆේන්ට්
මාව කලන්තේ කරන්න යනවා වගේ

I am feeling very unfit
අයැම් ෆීලිං වෙරි අන්ෆිට්
මට හරිම දුර්වල ගතියක් දැනෙනවා / මට කිසිම පණක් නැති ගතියක් දැනෙන්නේ

A- How long have you been feeling like this ?
හව් ලෝං හැව් යූ බීන් ෆීලින් ලයික් දිස් ?
ඔයාට මේ වගේ දැනෙන්න අරන් කොච්චර වේලාවක්ද / කාලයක්ද ?

Do you have a fever ?
ඩූ යූ හෑව් අ ෆීව(ර්) ?
ඔයාට උන තියෙනවද ?

Do you have a high temperature?
ඩූ යූ හෑව් අ හයි ටෙම්පරේච(ර්) ?
ඔයාට උන තියෙනවද ?

Do you have the flu ?
ඩූ යූ හෑව් ද ෆ්ලූ ?
ඔයාට උන හෙම්බිරිස්සාව තියෙනවද ?

Did you stay up late last night ?
ඩිඩ් යූ ස්ටේ අප් ලේට් ලාස්ට් නයිට් ?
ඔයා ඊයේ රෑ නිදි මැරුවද ?

Did you not sleep well last night ?
ඩිඩ් යූ නොට් ස්ලීප් වෙල් ලාස්ට් නයිට් ?
ඔයා ඊයේ රෑ හරියට නිදා ගත්තේ නැද්ද ?

Did you work too much yesterday ?
ඩිඩ් යූ ව(ර්)ක් ටූ මච් යෙස්ටඩේ ?
ඔයා ඊයේ ගොඩාක් මහන්සි වුනාද ?

B- Yes, I have a fever
යස් , අයි හෑව් අ ෆීව(ර්)
ඔව්, මට උන තියෙනවා

No , I don’t have a fever
නෝ, අයි ඩෝන්ට් හෑව් අ ෆීව(ර්)
නෑ,, මට උන නෑ

No, I don’t have the flu.
නෝ, අයි ඩෝන්ට් හෑව් ද ෆ්ලූ
නෑ, මට උන හෙම්බිරිස්සාව නෑ

Yes , I am having a slight attack of flu
ය(ර්)ස් , අයෑම් හැවිං අ ස්ලයිට් ඇටෑක් ඔෆ් ෆ්ලූ
ඔව් , මට පොඩි උණ හෙම්බිරිස්සාවක් තියෙනවා

I am having a slight headache
අයෑම් හැවිං අ ස්ලයිට් හෙඩේක්
මට පොඩි ඔලුවේ කැක්කුමක් තියෙනවා

I had very little sleep last night
අයි හෑඩ් වෙරි ලිට්ල් ස්ලීප් ලාස්ට් නයිට්
මම ඊයේ පොඩ්ඩයි නිදා ගත්තේ

I overworked yesterday
අයි ඕව(ර්)ව(ර්)ක්ඩ් යෙස්ටඩේ
මම ඊයේ ගොඩාක් වැඩ කළා

A: Do you have body pains?
ඩූ යූ හෑව් බොඩි පේන්ස්?
ඔයාගෙ ඇඟ රිදෙනවද ?

Do you feel weak?
ඩූ යූ ෆීල් වීක්?
ඔයාට දුර්වලද ගතියක් දැනෙනවද ?

Are you having trouble breathing?
ආ යූ හැවිං ට්‍රබල් බ්‍රීදිං ?
ඔයාට හුස්ම ගන්න අපහසුවක් තියෙනවද ?

Are you feeling short of breath?
ආ යූ ෆීලිං ශෝට් ඔෆ්(ශෝටොෆ්) බ්‍රෙත්?
ඔයාට හුස්ම ගන්න අමාරුද ?

Do you feel any chest pain?
ඩූ යූ ෆීල් එනි චෙස්ට් පේන්?
ඔයාට පපුවෙ වේදනාවක් දැනෙනවද ?

Is your stomach upset?
ඉස් යුව(ර්) ස්ටමක් අප්සෙට්?
ඔයාට බඩේ අමාරුවක් තියෙනවද ?

Are you feeling cold?
ආ යූ ෆීලිං කොල්ඩ්?
ඔයාට සීතලක් දැනෙනවද ?

B: My whole body is aching
මයි හෝල් බොඩි ඉස් ඒකිං
මට මුළු ඇඟම කකියනවා

I feel extremely weak.
අයි ෆීල් එක්ස්ට්‍රීම්ලි වීක්
මට හරිම දුර්වල බවක් දැනෙනවා

My chest feels tight.
මයි චෙස්ට් ෆීල්ස් ටයිට්
මගේ පපුව තදයි වගේ

It's hard to breathe
ඉට්ස් හාඩ් ටු බ්‍රීද්
හුස්ම ගන්න අමාරුයි

I have a sharp pain in my stomach.
අයි හෑව් අ ශාප් පේන් ඉන් මයි ස්ටමක්
මට තද බඩේ වේදනාවක් තියෙනවා

I cannot stand properly.
අයි කැනොට් ස්ටෑන්ඩ් ප්‍රොප(ර්)ළි
මට හරියට නැගිටින්න බැහැ

My head is spinning.
මයි හෙඩ් ඉස් ස්පිනිං
මට හිස කැරකෙනවා

I feel like I am going to vomit
අයි ෆීල් ලයික් අයෑම් ගොයිං ටු වොමිට්
මට දැනෙන්නේ මට වමනේ යන්න එනවා වගේ

I am sweating a lot.
අයෑම් ස්වෙටිං අ ලොට්
මට ගොඩක් දාඩිය දානවා

A- How long have you been feeling like this ?
හව් ලෝං හැව් යූ බීන් ෆීලිං ලයික් දිස් ?
කොච්චර වෙලාවක ඉදන් ඔයාට මේ වගේ දැනෙනවද ?

B- I have been feeling like this for the last two days
අයි හෑව් බීන් ෆීලිං ලයික් දිස් ෆෝ ද ලාස්ට් ටූ ඩේස්
පහුගිය දවස් දෙක තිස්සේ මට මේ වගේ දැනෙනවා

I have been feeling like this since this morning
අයි හෑව් බීන් ෆීලිං ලයික් දිස් සින්ස් දිස් මෝනින්
මට අද උදේ ඉදන් මේ වගේ දැනෙනවා

A- You need to take rest
යූ නීඩ් ටු ටේක් රෙස්ට්
ඔයා විවේක ගන්න අවශ්‍යයි

You better lie down here
යූ බෙට(ර්) ලයි ඩවුන් හියර(ර්)
ඔයා මෙහෙන් ඇලවෙන එක හොදයි

Lie down here and take rest for some time
ලයි ඩවුන් හියර(ර්) ඇන්ඩ් ටේක් රෙස්ට් ෆෝ සම් ටයිම්
මෙතනින් ඇලවෙලා ටික වෙලාවක් විවේක ගන්න

Take two paracetamol and lie down for a while
ටේක් ටූ පැරසිටමෝල් ඇන්ඩ් ලයි ඩවුන් ෆෝ අ වයිල්
පැරසිටමෝල් දෙකක් අරන් ටිකක් වෙලාවක් ඇලවෙලා ඉන්න

Do you want to go back home ?
ඩූ යූ වෝන්ට් ටු ගෝ බැක් හෝම් ?
ඔයාට ආපහු ගෙදර යන්න ඕනෙද ?

Do you want to see a doctor ?
ඩූ යූ වෝන්ට් ටූ සී අ ඩොක්ට(ර්)
ඔයාට ඩොක්ට(ර්) කෙනක්ව බලන්න ඕනෙද ?

B- Yes, I want to go home
යස් , අයි වෝන්ට් ටු ගෝ හෝම්
ඔව් , මට ගෙදර යන්න ඕන

I think I should go home
අයි තිංක් අයි ෂුඩ් ගෝ හෝම්
මං හිතන්නේ මං ගෙදර යන්න ඕන

I think I better go home
අයි තිංක් අයි බෙට(ර්) ගෝ හෝම්
මං හිතන්නේ මං ගෙදර යන එක හොදයි

No , I don’t think I need to see a doctor
නෝ, අයි ඩෝන්ට් තිංක් අයි නීඩ් ටු සී අ ඩොක්ට(ර්)
නෑ , මම හිතන්නේ නැහැ මට ඩොක්ට(ර්) කෙනකේ බලන්න අවශ්‍යයි කියලා

I just need some rest
අයි ජස්ට් නීඩ් සම් රෙස්ට්
මට පොඩි විවේකයක් විතරයි ඕන (මෙතන just කියන වචනයෙන් එපමණයි , එච්චරයි , විතරයි කියන තේරුම එනවා)

I will stay lying down here
අයි විල් ස්ටේ ලයිං ඩවුන් හියර්)
මම මෙතන ඇලවෙලා ඉන්නම්

I will be alright in a few minutes
අයි විල් බී ඕල්රයිට් ඉන් අ ෆිව් මිනිට්ස්
මිනිත්තු කීපයකින් මට හරියයි

A - How do you feel now ?
හව් ඩූ යූ ෆීල් නව් ?
දැන් ඔයාට කොහොමද ? (දැනෙන්නේ කොහොමද ?)

Are you feeling better ?
ආ යූ ෆීලිං බෙටර්)
ඔයාට හොදද ? (සුවයක් දැනෙනවද ?)

How are you feeling now ?
හව් ආ යූ ෆීලිං නව් ?
දැන් ඔයාට කොහොමද ? (දැන් ඔයාට දැනෙන්නේ කොහොමද ?)

Has your condition improved ?
හෑස් යුවර්) කන්ඩිෂන් ඉම්පෲව්ඩ්
ඔයාගේ තත්වය හොද අතට හැරිලද ?

B- I am feeling better now
අයෑම් ෆීලිං බෙටර්) නව්
මට දැන් හොදයි (දැන් සුවයක් දැනෙන්නවා)

I feel much better
අයි ෆීල් මච් බෙටර්)
මට ගොඩක් හොදයි (ගොඩක්ම සුව දැනෙනවා)

I feel slightly better
අයි ෆීල් ස්ලයිට්ලි බෙටර්)
මට ටිකක් හොදයි (තරමක් සුව දැනෙනවා)

I feel just the same
අයි ෆීල් ජස්ට් ද සේම්
මට ඒ විදියම තමයි (ඒ විදියම තමයි දැනෙන්නේ)

I am not feeling better
අයෑම් නොට් ෆීලිං බෙට(ර්)
මට හොදක් දැනෙන්නේ නැහැ

My condition hasn’t improved yet
මයි කන්ඩිෂන් හැස්න්ට් ඉම්ප්‍රෘව්ඩ් යෙට්
මගේ තත්වය හොද අතට හැරිලා නැහැ තවම

A- Have you taken any medicine yet?
හැව් යූ ටේකන් එනි මෙඩිසින් යෙට් ?
ඔයා මොනවා හරි බෙහෙතක් අරගෙනද ?

Should I call your parents?
ෂුඩ් අයි(ෂුඩයි) කෝල් යුව(ර්) පේරන්ට්ස් ?
මම ඔයාගේ දෙමව්පියන්ට කතා කරන්නද ?

B- I haven’t taken any medicine yet.
අයි හැව්න්ට් ටේකන් එනි මෙඩිසින් යෙට්
මම තවම කිසිම බෙහෙතක් අරන් නැහැ

Yes, please call my parents.
ය(ර්)ස් , ප්ලීස් කෝල් මයි පේරන්ට්ස්
ඔව් ,කරුණාකර මගේ දෙමව්පියන්ට කතා කරන්න

A- Would you like some water or fruit juice?
වුඩ් යූ ලයික් සම් වෝට(ර්) ?
ඔයා වතුර ටිකක් හරි පලතුරු යුෂ ටිකක් ගන්න කැමතිද ?

Do you need anything else?
ඩූ යූ නීඩ් එනිතිං එල්ස් ?
ඔයාට වෙන මොනවා හරි අවශ්‍යද ?

B- A glass of water would be nice, thank you.
අ ග්ලාස් ඔෆ් වෝට(ර්) වුඩ් බී නයිස් .තැන්ක් යූ
වතුර වීදුරුවක් හොදයි , ස්තූතියි

No, I don’t need anything else right now.
නෝ , අයි ඩෝන්ට් නීඩ් එනිතින් එල්ස් රයිට් නව්
මට දැන් වෙන මුකුත් එපා

A : Don’t worry, you will be fine soon.
ඩෝන්ට් වොරි , යූ විල් බී ෆයින් සූන්
හිත අවුල් කරගන්න එපා, ඔයා ටිකකින් හොද වෙයි (worry කියන්නේ ඇත්තටම යමක් ගැන අසහනයට පත් වෙනවා , ඒ ගැන වද වෙනවා කියන එක. මේ අවස්ථාවේදී නම්

ඇත්තටම මේ වෙලාවේ සිංහලෙන් මේ අදහස කියවෙන්න ඉඩ තියෙන්නේ බය වෙන්න එපා කියලා , සෘජු තේරුම ඒක නොවුනත්)

Relax, you just need some rest.
රිලැක්ස්, යූ ජස්ට් නීඩ් සම් රෙස්ට්
සැහැල්ලු වෙන්න , ඔයාට විවේකයක් විතරයි අවශ්‍යයි

Don't be scared, this medicine will help.
ඩෝන්ට් බී ස්කෙයාඩ් , දිස් මෙඩිසින් විල් හෙල්ප්
බිය වෙන්න එපා, මේ බෙහෙතින් හරි යයි]

Take it easy, your condition will get better.
ටේක් ඉට් ඊසි , යුව(ර්) කන්ඩිෂන් විල් ගෙට් බෙට(ර්)
ගණන් ගන්න එපා , ඔයාගේ තත්ත්වය හොඳ වෙයි

Don't worry, we will take you to the hospital quickly.
ඩෝන්ට් වොරි, වී විල් ටේක් යූ ටූ ද හෝස්පිටල් ක්වික්ලි
බය වෙන්න එපා , අපි ඔයාව ඉක්මනට ඉස්පිරිතාලෙට ගෙනියනවා

You will be alright in a few minutes.
යූ විල් බී ඕල්රයිට් ඉන් අ ෆිව් මිනිට්ස්
මිනිත්තු කිහිපයකින් ඔයාට හොඳ වෙයි

Vocabulary 35

Posh – පොෂ් – අලංකාර පෙනුමැති , විලාසිතාකාර , උසස් පෙනුමැති

Library – ලයිබ්‍රරි – පුස්තකාලය

Rough – රෆ් – රළු

Predict – ප්‍රෙඩික්ට් – පුරෝකථනය කරනවා , කලින් කියනවා

Predictable – ප්‍රෙඩික්ටබල් – කලින් කිව හැකි

Unpredictable – අන්ප්‍රෙඩික්ටබල් – අනාවැකි කිව නොහැකි

Stubborn – ස්ටබ(ර්)න් – මුරණ්ඩු , හිතුවක්කාර

Exciting – එක්සයිටිං – උද්යෝගීමත් , උනන්දුව ඇතිකරවන සුළු

Dangerous – ඩේන්ජරස් – අවදානම් , අනතුරුදායක

Unfit – අන්ෆිට් – සුදුසු නොවන , ශක්තිය අඩු

Temperature – ටෙම්පරේච(ර්) – උෂ්ණත්වය

Overwork – ඕව(ර්)ව(ර්)ක් – අධිකව වැඩ කරනවා , එසේ කිරීම

Pain – පේන් – වේදනාව , වේදනා දෙනවා

Whole – හෝල් – මුළු , සම්පූර්ණ

Extremely – එක්ස්ට්‍රීම්ලි – අතිශයින්ම

Tight – ටයිට් – තද

Scare – ස්කෙයා – බය කරනවා

Scared – ස්කෙයාඩ් – බියවූ , බියට පත්

Honest – ඔනස්ට් – අවංක

Dishonest – ඩිස්ඔනස්ට් – අවංක නොවන

Brave – බ්‍රේව් – ධෛර්යවන්ත

Lazy – ලේසි – අලස

Active – ඇක්ටිව් – ක්‍රියාශීලී

Dangerous – ඩේන්ජරස් – අනතුරුදායක

Ordinary – ඔ(ර්)ඩිනරි – සාමාන්‍ය

Modern – මොඩ(ර්)න් – නවීන

Traditional – ට්‍රඩිෂනල් – සාම්ප්‍රදායික

Comfortable – කම්ෆටබල් – සුවපහසු

Understand – අන්ඩස්ටෑන්ඩ් – තේරුම් ගන්නවා

Understandable – අන්ඩස්ටෑන්ඩබල් – තේරුම් ගත හැකි

Agree – ඇග්‍රී – එකඟ වෙනවා

Agreeable – ඇග්‍රීයබල් – එකඟ විය හැකි

Accept – ඇක්සෙප්ට් – පිළිගන්නවා

Acceptable – ඇක්සෙප්ටබල් – පිළිගත හැකි

Change – චේන්ජ් – වෙනස් කරනවා

Changeable – චේන්ජබල් – වෙනස් විය හැකි

Unchangeable – අන්චේන්ජබල් – වෙනස් කළ නොහැකි

Comfort – කම්ෆට් – සැනසීම දෙනවා

Comfortable – කම්ෆටබල් – සුවපහසු

Uncomfortable – අන්කම්ෆටබල් – අපහසු

Use – යූස් – භාවිතා කරනවා

Useful – යූස්ෆුල් – ප්‍රයෝජනවත්

Useless – යූස්ලස් – ප්‍රයෝජන රහිත

Respect – රෙස්පෙක්ට් – ගෞරව කරනවා

Respectable – රෙස්පෙක්ටබල් – ගෞරවයට සුදුසු

Care – කෙයා – සැලකිලි දක්වනවා

Careful – කෙයාෆුල් – සැලකිලිමත්

Careless – කෙයාලස් – නොසැලකිලිමත්

Success – සක්සෙස් – සාර්ථකත්වය

Successful – සක්සෙස්ෆුල් – සාර්ථක

Unsuccessful – අන්සක්සෙස්ෆුල් – අසාර්ථක

Bladder – බ්ලැඩ(ර්) – මුත්‍රාශය

Black mark – බ්ලැක් මාක් – නරක නාමය , කැළල

Blush – බ්ලෂ් – ලැජ්ජාවෙන් රතු වෙනවා

Bottom – බොටම් – පහළ කොටස, පතුල , අඩිය

Bowel – බවල් – බඩවැල

Brag – බ්‍රැග් – කයිවාරු ගහනවා , පුරාජේරු කියනවා

Embankment – එම්බෑන්ක්මන්ට් – බැම්ම,කන්ඩිය වේල්ල

Emblem – එම්බ්ලම් – ලාංඡනය, සංකේතය

Emerge – ඉම(ර්)ජ් – මතු වෙනවා, මතුවී පෙනෙනවා
Embryo – එම්බ්‍රියෝ – භ්‍රෑණය
Heap – හීප් – ගොඩ, රාශිය
Heaven – හෙවන් – ස්වර්ගය
Iguana – ඉගුවානා – තලගොයා
Illicit – ඉලිසිට් – නීති විරෝධී, අවසර නොලත්
Impolite – ඉම්පොලයිට් – අශිෂ්ට, නොහොබිනා